# විරුකියාව

- කොළඹ ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති සිතුවමකි.
- මුදලිඳු ඒ.සී.ජී.එස්. අමරසේකර මහතා විසින් තෙල් සායමෙන් කැන්වසය මත සිතුවම් කර ඇත.
- ශිල්පියා විසින් මෙය ‘විරුකියාව’ ලෙස නම් කර ඇතත් කලා රසිකයන් අතර මෙය වඩාත් ප්‍රචලිතව ඇත්තේ ‘වඩුවාගේ ගෙදර’ යන නාමයෙනි.
- වඩු ගෙදර දරිද්‍රතාව මෙම සිතුවමට වස්තු විෂයය වී ඇත.
- අඳුරු වර්ණ මාලාවත් ජැනේලයෙන් ගලා එන මන්දාලෝකයත් සිතුවමේ තේමාවට මනාව ගලපා තිබේ.
- ආලෝකය මෙන් ම අඳුර ද, ඒ ආලෝකය නිවැසියන් හා ගෘහ භාණ්ඩ මත පතිත වී ඇති ආකාරය ද ඉතා තාත්විකය.
- ආලෝකය හා අඳුර ශිල්පියා විසින් පාලනය කර ඇති ආකාරය තුළ යුරෝපා ශාස්ත්‍රාලයීය කලාවේ කියුරොස්කුරෝ ලක්ෂණය ගැබ් වී ඇත.
- සංගත වර්ණ මාලාවක් බඳු සම්භාව්‍ය වර්ණ මාලාවක් ශිල්පියා විසින් යොදාගෙන තිබේ.
- මානව රූප වල බාහිර ස්වරූපය මෙන් ම අභ්‍යන්තර සිතුවිලි පරපුර ද ශිල්පියා විසින් මැනවින් නිරූපණය කර තිබේ.
- කුසගින්න ඔවුන්ගේ ප්‍රධාන ගැටළුව බවට පත් වී ඇත. වඩු කාර්මිකයාගේ කකුළෙහි වෙලෙන බළලාත්, කුසගිනි දුක නිසා එක් කකුළක් නවාගෙන සිතුවමේ අඳුරු මුල්ලේ ඇඳක වැතිර සිටින දරුවාත් ඒ පිළිබඳ සංකේත වේ.
- සිතුවමේ විද්‍යාත්මක පර්යාවලෝකනයක් දක්නට ලැබේ.
- සිතුවමේ ඉදිරි බිම, මැද බිම හා පසුබිම තුළ හැඩතල ඉතා සමබරව සම්පිණ්ඩනය කර ඇත.
- වර්ණ පර්යාවලෝකනය ද මනාව දක්වා තිබේ.

සැකසුම - අමිල කෝසල උඩවත්ත.

Copyright © e-thaksalawa.moe.gov.lk



Copyright © e-thaksalawa.moe.gov.lk